සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 6 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I/II | පැය / மணித்தியாலம் / Hours: 02 |

**සැලකිය යුතුයි**

- **පළමු කොටසෙහි අංක 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. 1,11 පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.**

---

1) අනුපිළිවෙළින් ස්වර දක්වා ඇති පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
   1. අ,ආ,ඉ,ඊ,උ  2. ඔ,ඕ,ඖ.එ, ඓ
   3. උ,ඍ,ඎ, එ,ඒ  4. ඈ,ඉ,ඊ,උ,ඌ

2) 'උඩැල්ල' යන වචනයෙහි ස්වර හා ව්‍යඤ්ජන වෙන් කළ විට නිවැරදි පිළිතුර වන්නේ,
   1. අ+උ+ද්+ඈ+ල්+අ  2. උ+ඇ+ද්+අ+ල්+අ
   3. උ+ද්+ඇ+ල්+ල්+අ  4. උ+ද්+අ+ල්+ල්+අ

- 3 හා 4 ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශන අතුරින් අක්ෂරමාලාව සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

3) 1. අක්ෂරමාලාව කොටස් තුනකට බෙදේ.
   2. ස්වර සංඛ්‍යාව 18 කි.
   3. වචනයක මුල් ශබ්දය ස්වරයක් වූ විට පිළි යෙදිය යුතුම ය.
   4. වචනයක මැද ස්වර යෙදීමට හැකියාවක් නැත.

4) 1. ව්‍යඤ්ජන තනිව උච්චාරණය කළ හැකි ය.
   2. සෑම ව්‍යඤ්ජනාක්ෂරයක් ම හල් කළ හැකි ය.
   3. ස්වර අක්ෂර නොයෙදෙන වචන භාෂාවේ භාවිත වේ.
   4. අක්ෂරමාලාවේ ඇති ස්වර අකුරු හැර සෙසු අකුරු සියල්ල ව්‍යඤ්ජන අක්ෂර වේ.

5) රූපය, රබාන, මාපිය, යන වචනවල ඉරි ඇඳි අකුරේ යෙදී ඇති පිල්ලමේ නාමය පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.
   1. ඉස්පිල්ල, දිගු පාපිල්ල, ඇලපිල්ල
   2. දිගු පාපිල්ල,ඇලපිල්ල, ඉස්පිල්ල
   3. ඇලපිල්ල, ඉස්පිල්ල,දිගු පාපිල්ල
   4. ඇලපිල්ල, දිගු පාපිල්ල, ඉස්පිල්ල

6) පහත සඳහන් ස්වර අතුරින් පිල්ලමකින් සංකේතවත් නොවන ස්වරය වන්නේ,
   1. උ  2. අ  3. ඉ  4. ඔ

- 7 හා 8 ප්‍රශ්න සඳහා දී ඇති වචනවලට සමානාර්ථ දෙන වචන තෝරන්න.
  7) ඉඩෝරය; 1. කාන්තාරය 2. නියඟය 3. නාය යෑම 4. භූ චලනය
  8) සුදඟ ගින්න; 1. ලැව් ගින්න 2.සුදු පැහැ ගින්න 3.කුසගින්න 4.කුඩා ගින්න

- 9 හා 10 ප්‍රශ්න සඳහා දී ඇති වචනවලට විරුද්ධාර්ථය දෙන වචන තෝරන්න.
  9) නිශ්චල; 1.නොසැලෙන 2. පැතිරෙන 3.සෙලවෙන 4. එළඹෙන
  10) දිළිඳු ; 1.හිතවත් 2.දුප්පත් 3. බලවත් 4.ධනවත්

11) නාම පද වර්ගීකරණය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,
1. වචන භේදය පදනම් කරගෙන නාම පද වර්ගීකරණය කෙරේ.
2. උක්ත අනුක්ත භේදය පදනම් කරගෙන නාම පද වර්ගීකරණය කෙරේ.
3. ලිංග භේදය පදනම් කරගෙන නාම පද වර්ගීකරණය කෙරේ.
4. කාල භේදය පදනම් කරගෙන නාම පද වර්ගීකරණය කෙරේ.

12) පහත දී ඇති පද අතුරින් උක්ත නාම පදය තෝරන්න.
1. තොප 2.මා 3.තොපි 4. ළමයින්

13) පහත දී ඇති පද අතුරින් අනුක්ත නාම පදය තෝරන්න.
1. මිනිස්සු 2.ඔවුන් 3.අපි 4.හෙදියෝ

14) පහත නාම පද අතුරින් අචේතනික නාම පදය තෝරන්න.
1. ගිරවා 2.බැළලිය 3. රාස්සි 4. නිවස

15) පහත නාම පද අතුරින් ප්‍රථම පුරුෂ ඒක වචන නාම පදය තෝරන්න.
1. මම 2. නුඹලා 3. මිනිසා 4. අපි

16) පෙළ පොතේ පාඩම් අතුරින් සොබා දහමේ ආශ්චර්යයෙන් මිනිස් ජීවිත ප්‍රබෝධවත් වන ආකාරය පැවසෙන පාඩමක් වන්නේ,

1. නරි නයිදේ රැවටිච්චී 2. උදය සිරි
3. අපි කවි ලියමු 4. සිරිත් හොඳ දැනගෙන

17) 'විවෙං චුලංගෙං යමු කිරි නැනෝ' පාඩමෙහි සඳහන් වන පරිදි කුඩමසුන් අල්ලා ගැනීමට වැද්දන් යෙදූ උපක්‍රමයක් නොවන්නේ,
1. පුස්වැල් කැබලි තළා දියට දැමීම
2. කුකුරුමුවන් ගෙඩි තළා දියට දැමීම
3. කුඹුක් ඇට තළා දියට දැමීම
4. දළුක් කිරි එකතු කර දියට දැමීම

18) පහත දැක්වෙන පද්‍ය කොටසේ ඉරි ඇඳි පදයට නොගැළපෙන අර්ථයක් දෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

"එක ම වැඩක <u>නිතර ම</u> නොයෙදෙන්නේ
වෙන ම වෙන ම වැඩ සලකා ගන්නේ

1. නිරන්තරයෙන් 2. සතතයෙන් 3.අනවරතයෙන් 4. අතරතුර

- 19 හා 20 යන ප්‍රශ්න සඳහා හිස්තැනට ගැළපෙන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

19) ------------------- පෙරහැර අලංකාර කරයි.

1. ඇතුන් 2. ඇතා 3. ඇතෙකු 4.ඇත්තු

20) ---------------- ශිෂ්‍යයන් අගය කරති.

1. ගුරුවරයා 2. ගුරුවරුන් 3.ගුරුවරිය 4. ගුරුවරු (ලකුණු 2 x 20= 40)

## <u>11 කොටස</u>

**1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ. 3,4,5,6,7 ප්‍රශ්නවලින් තුනක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

1) ඔබ පන්ති කාමරයේ දී සකස් කළ පොත් පිංච ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
   i. පොත් පිංචට යෙදූ නම කුමක් ද? (ලකුණු 02)
   ii. එම පොත් පිංච සකස් කිරීමේ දී ඔබට පැවරුණු කාර්යය කුමක් ද? (ලකුණු 02)
   iii. පොත් පිංච සඳහා ඇතුළත් කළ ලිපි **දෙකක** මාතෘකා සඳහන් කරන්න. (ලකුණු 04)
   iv. ඒ සඳහා තොරතුරු ලබා ගත් මූලාශ්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)
   v. මෙබඳු නිර්මාණයක් කිරීමෙන් ඔබට අත්වන ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16)

2) පහත දැක්වෙන මාතෘකා අතරින් **එකක්** තෝරා ගෙන **වචන 125** කට නො අඩු වන සේ රචනයක් ලියන්න.
   I. යහ-ගුණදම් වඩමු උතුම්
   II. සුන්දර පාන්දර
   III. ආදි වාසියෙකු දවස ගෙවන හැටි
   IV. මා දුටු පුරාණ පුදබිම

(ලකුණු 14)

3) ඔබ පසුගිය දිනෙක සීගිරියේ අධ්‍යාපන චාරිකාවක යෙදුනේ යැයි සිතා එහි දී ඔබ දුටු දේ, හමු වූ අය,විනෝද වූ අයුරු,උගත් දේ යනාදි තොරතුරු ඇතුළත් කොට විදේශ ගතව සිටින ඔබේ මවට ලිපියක් ලියන්න. (ලකුණු 10)

4) පහත සඳහන් පාඨ උපුටා ගත් ග්‍රන්ථ නාම හා කතුවරුන් ලියා වගුව සම්පූර්ණ කරන්න.

| පාඨය | උපුටා ගත් ග්‍රන්ථයේ නම | කතුවරයා |
|---|---|---|
| 1 " හා ,හා, මම එහෙමත් කරනව ද?" | ............................ | ........................... |
| 2 " මහවනය රාත්‍රී කාලයේ ශාන්ත හෝ නිශ්චල හෝ නොවේ' | . ........................... | . ........................... |
| 3 "ඔහු බිම සදාලා ගෙදර ඇවිත් වැපිරීමට වී ඉල්ලුවේ ය. | ........................... | ............................ |
| 4 "අනුන්ට බුහුමන් දී සලකන්නේ" | . ........................... | ............................ |
| 5 "එතැන් සිට රෑ ගතවන තුරු උඳුනෙන් නගින ගින්න නොනිවේ." | ........................... | ............................ |

(ලකුණු 10 )

5) පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කා හට කරන ලද්දේ දැයි ලියා වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රකාශය | කවුරුන් විසින් ද? | කාහටද? |
|---|---|---|
| 1" අනේ යන තැනකට මාත් කැටුව යන්ට." | ...................................... | . ......................... |
| 2 " එහෙනම් ගිහින් හොයා ගෙන වරෙල්ලා " | ...................................... | ......................... |
| 3 "ඒකත් හරි තමා " | .................................... | ........................... |
| 4 "ඔහු ගැන මම චංචලව සිටිමි. " | ...................................... | ............................ |
| 5 " අපූරු අමුතු දෙයක් සොයා ගත්තොත් නුඹට මුළු කැලේ පුරාම කියව කියවා ඇවිදිතැකි" . | ..................................... | ................................. |

(ලකුණු 2 x 5= 10)

6) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ක්‍රිකට් ක්‍රීඩාවේ උපත සිදු වූයේ එංගලන්තයේ ය. 13 වන සියවසේ මැද භාගයේ දී ක්‍රිකට් ක්‍රීඩාව එංගලන්තයේ ඇරඹුණු බවට සාක්ෂ්‍ය කලාකරුවන් විසින් අඳින ලද සිතුවම් මගින් ලැබී ඇත.ශීත රටක් බැවින්, තම ශරීරයේ උෂ්ණත්වය ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රිකට් ක්‍රීඩාව ප්‍රයෝජනවත් වේ යැයි සිතූ ඉංග්‍රීසි ජාතීහු ක්‍රමයෙන් ක්‍රිකට් ක්‍රීඩාව තම ප්‍රාන්ත අතර ජනප්‍රිය කළහ. 1968 දී සාන්ත ඇල්බන්ස් ක්‍රිකට් සමාජය බිහිවුණු බවත් ඉන් අනතුරුව, ක්‍රමයෙන් ක්‍රිකට් ක්‍රීඩාව ප්‍රචලිත වුණු බවත් ඉතිහාසයේ සටහන් වේ. 18 වන සියවස ඇරඹෙත් ම ක්‍රිකට් ක්‍රීඩාව, ක්‍රමවත් නීතිරීති පද්ධතියක් යටතේ පවත්වන්නට කටයුතු සැලසිණි.වාර්තාගත ප්‍රථම ක්‍රිකට් තරගය 1697 දී සසෙක්ස්හි දී පැවති බවත්, මේ තරගයට එක් පිළකට එකොළොස් දෙනා බැගින් සහභාගි වුණු බවත්, මෙම තරගය ගිණි පනහක ඔට්ටුවක් සඳහා දෙපිළ අතර පැවති බවත් සඳහන් වේ.

i. ක්රිකට් ක්‍රීඩාවේ උපත සිදු වූ රට හා ක්‍රිකට් ක්‍රීඩාව ආරම්භ වූ කාල වකවානුව සඳහන් කරන්න.
ii. ඉංග්‍රීසි ජාතිකයන්හට ක්‍රිකට් ක්‍රීඩාවෙන් අත් වූ ප්‍රයෝජනය කුමක් ද?
iii. ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් 18 වන සියවසෙහි ආරම්භය වැදගත් වන්නේ ඇයි?
iv. ප්‍රථම ක්‍රිකට් තරගය පැවැත් වූ ස්ථානය නම් කරන්න.
v. බිහිවුණු, ප්‍රචලිත යන වචනවල අර්ථ ලියන්න.

(ලකුණු 2 x 5= 10)

7) පහත පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ටින් කබලකට කෝටුවකට සටන් කොට
තොල් පෙරළමින් කඳුළෙන් ඉදිරියෙන් සිට
එන විට කුඩා දරුවා නඩු කියන්නට
සිප සනසවනු හැක කවියකු ලෙසින් මට

බැනියම ඉරී තිබුණොත් එය ඇඟිලි කොනින්
කොනහා එතැන ලොකු කරවන අසුර සැනින්
පොඩි දඟකාරයන් රනක් ලැබුව පිනින්
මම සැප විඳිමි අන් සැපතක් කුමට වෙනින්

i. පළමු පද්‍යයට අනුව කුඩා දරුවා සටන් කළේ ඇයි?
ii. ඔහු නඩු කියන්නට පැමිණියේ කවර ආකාරයකින් ද?
iii. කවියා එම නඩු විසඳුවේ කෙසේ ද?
iv. දෙවන පද්‍යයෙන් විස්තර වන දඟ වැඩය කුමක් ද?
v. " සටන් කොට" "අසුර සැනින්" යන වචන සඳහා අර්ථ ලියන්න.

( ලකුණු 2 x 5 = 10 )